# රොබට් නොක්ස් හා විවාහය

පුද්ගලයකු හෝ ආත්මයක් හෝ නැති බව සිංහල බෞද්ධයන් ඉගෙනගන්නේ කුඩා අවදියෙහි ය. එහෙත් ඒ වන විට බිළිඳා මම යන සංකල්පය ඇතිකරගෙන අවසාන ය. ලකානියානු මනෝවිශ්ලේෂණය අනුව බිළිඳකු මම යන සංකල්පය ඇතිකරගන්නේ ඊනියා අනෙකකුගේ ආධාරයෙන් දර්පණයක දිස්වෙන තම ප්‍රතිබිම්බය ඇසුරෙන් ය. මේ කසිකබල් ප්‍රවාදය අනුව දර්පණ හෝ එවැනි වෙනත් උපකරණ හෝ නැත්නම් මම යන සංකල්පය ඇති නො වෙයි. එහෙත් එහි වඩාත්ම අසංගත කරුණ එය නො වෙයි. ලකානියානු මනෝවිශ්ලේෂණයට අනුව බිළිඳා මම යන සංකල්පය ඇතිකරගැනීමට පෙර අනෙකා යන සංකල්පය ඇතිකරගනියි. දැන් ප්‍රශ්නය වනුයේ අනෙකා යන සංකල්පය ඇතිකරගනු ලබන්නේ කවරකු විසින් ද යන්න ය. මම යන සංකල්පය ඇතිකරගැනීමට පෙර බිළිඳාට අනුබද්ධයෙන්, එනම් බිළිඳාට සාපේක්ෂව බිළිඳා නැත. එසේ නම් අනෙකා යන සංකල්පය ඇතිකරගැනීමට ද බිළිඳකු නැත.

බටහිර ජීව විද්‍යාවට අනුව ද මම යන සංකල්පය මිනිසුන්ට හැරෙන්නට චිම්පන්සීන්ට, ඩොල්ෆින් නමින් හැඳින්වෙන සතුන්ට හා අලින්ට ද වෙයි. බටහිර ජීව විද්‍යාවට අනුව නොවුව ද, අනෙක් සතුන්ට මම යන සංකල්පය නැතැයි මෙයින් නොකියැවෙන බව ද අමතක නොකළ යුතු ය. බටහිර ජීව විද්‍යාවේ අලි තමන් ගැන සවිඥානික වන බව පෙන්වීම සඳහා දර්පණතල යොදාගනිමින් පර්යේෂණකෙරී තව ම වැඩි කලක් නැත. ඒ පිළිබඳ වාර්තාවක් සති දෙකකට පමණ පෙර නිව් සයන්ටිස්ට් සඟරාවෙහි පළ වී තිබුණි. කලින් ද කෙරී ඇති මෙවැනි පර්යේෂණ සමග ලකානියානු ප්‍රවාදය අනාථ වී ඇති බව ලකානියානු මනෝවිශ්ලේෂණය පසුපස යන්නෝ නො දනිති. ලකානියානු ප්‍රවාදයට අනුව බිළිඳකු තමාගේ ප්‍රතිබිම්බය ඔස්සේ මම යන සංකල්පය නිර්මාණයකිරීමේ දී බිළිඳාගේ මව ද ඒ සඳහා උපකාරී වෙයි. අලි පැටවාට මම යන සංකල්පය නිර්මාණයකිරීමේ දී අලි අම්මාගේ හෝ වෙනත් අනෙකකුගේ හෝ ආධාර ලැබුණු බවක් සඳහන් නො වෙයි.

බංකොළොත් ලකානියානු සංකල්ප හා ප්‍රවාද කෙසේවෙතත්, සිංහල බෞද්ධයන්ට අනුව මව්කුසේදීත් දරුගැබටත් මම යන සංකල්පය ඇත. කෙටියෙන් කිවහොත් ප්‍රතිසන්ධි චිත්තය ද ඇතිවන්නේ මම යන සංකල්පය ඇත්තකුට ය. බිළිඳකු ලොවට බිහිවන්නේ ම මම යන සංකල්පය ඇතිව ය. ඒ බිළිඳා තරමක් වැඩුණු පසු සිංහල බෞද්ධ සමාජයෙන් මම යනුවෙන් කෙනකු නැති බව ඉගෙනගනියි. එහෙත් ඒ ඉගෙනුම බුද්ධියෙන් ලබාගන්නා එකක් පමණකි. මේ බුද්ධිමය දැනුමට පටහැණිව සිංහල බෞද්ධ දරුවාට මම යන හැඟීම ඇත. ඒ හැඟීම නැතිවන්නේ නිවන් අවබෝධයත් සමග ය. නිවන් අවබෝධය බුද්ධියෙන් ලබාගන්නා දෙයක් නො වෙයි.

සිංහල බෞද්ධයෝ බුද්ධියෙන් ආත්මයක්, පුද්ගලයකු නැති බව දනිති. එහෙත් හැඟීමෙන් ඔවුන්ට මම යන සංකල්පය වෙයි. එපමණක් නොව නිවන් අවබෝධය සඳහා ද වෙනත් කිසිවකුගේ සහාය නො ලැබෙයි. නිවන් අවබෝධය සඳහා සම්මුති සත්‍යයෙන් දැනගන්නා පුද්ගලයා අවශ්‍ය වෙයි. මේ හේතුවෙන් සිංහල බෞද්ධයනට වාපී සංස්කෘතියෙන් ලැබුණු සමාජයීය වශයෙන් ගත්කල ඉතා දැඩි සාමූහිකත්වයක් තිබූ අතර පුද්ගලයකු නැතිව ද ආත්මීය පෞද්ගලිකත්වයක් තිබුණි. සිංහල බෞද්ධයන් උත්සාහකරන්නේ මේ නැති පුද්ගලයා නැති පුද්ගලයකු ලෙස නැති මනසින් අවබෝධකරගැනීමට ය.

ථෙරගාථා හා ථෙරීගාථා මෙන් ම ජාතකකතා ද මේ නැති පුද්ගලයා නැති පුද්ගලයකු ලෙස අවබෝධකරගැනීමට උපකාරී වෙයි. ඒ උපකාරය ලැබෙන්නේ පුද්ගලයකු ඇතැයි සිතනවිට ඒ පුද්ගලයා ලෙස සිතන්නා යහමග යැවීමෙන් ය. අප කලින් සඳහන්කර ඇති පරිදි යහමග යනු සිංහල බෞද්ධයන් සම්බන්ධයෙන් ගත්කල නිවනට සාපේක්ෂ වූ යහමගකි. එනම් නිවන් අවබෝධයට සාපේක්ෂ යහමග යැවීමකි. ථෙරගාථා හා ථෙරීගාථා ස්වයංචරිතාපදාන නො වෙයි. රහතන්වහන්සේ නමක සම්බන්ධයෙන් ස්වයංචරිතාපදානයක් යන්න ම එක් අතකින් ගත්කල විහිළුවකි. නැති පුද්ගලයා නැති පුද්ගලයකු බව අවබෝධකළ විට පුද්ගලික කරුණු යනුවෙන් සැඟවිය යුතු කිසිවක් නැත. පුද්ගලයකු ඇතැයි සිතූ අවධියෙහි කළ කී දෑ කිසිම චකිතයකින් තොරව පුද්ගලයන් ඇතැයි වර්තමානයෙහි ද සිතන්නන් යහමග යැවීම සඳහා කියාපෑම ස්වයංචරිතාපදානයක් ලෙස නොසිතිය යුතු ය. ථෙරගාථා හා ථෙරීගාථා

© Prof. Nalin De Silva

ස්වයංවරිතාපදානයන් නොවන්නේ ඒ ගාථා කී අයට ආත්මීය හෝ වෙනත් කිසියම් හෝ පෞද්ගලිකත්වයක් නොතිබූ බැවින් ද වෙයි.

සිංහල බෞද්ධයන් අතර වූ ආත්මීය පෞද්ගලිකත්වය අද අපේ සමාජයට පිළිලයක් වී ඇත. එයට හේතුව වී ඇත්තේ එදා සමාජයේ වූ ඉතා දැඩි සමාජයීය සාමූහිකත්වය අද සිංහල සමාජයේ නො තිබීම ය. එදා සමාජයීය සාමූහිකත්වය මගින් ආත්මීය පෞද්ගලිකත්වය පාලනය වුව ද, අද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය හේතුකොටගෙන සමාජයීය පෞද්ගලිකත්වය ද ඉදිරියට පැමිණ ඇත. එහි ප්‍රතිඵලයක් වී ඇත්තේ වර්තමානයෙහි සිංහල බෞද්ධයන්ගේ පෞද්ගලික අපේක්ෂා වර්ධනය වීම ය. එමෙන් ම සිංහල බෞද්ධයෝ බොහෝවිට අද තම වර්ධනය වූ පෞද්ගලිකත්වවලට කැළලක් වීමට ඉඩ නො දෙති. මෙරට ලේඛකයන් තම ස්වයංවරිතාපදාන ලිවීමේ දී ප්‍රවේසම් වී තම දුර්වලකම් හෙළිනොකරන්නේ මේ හේතුවෙනි. එමෙන් ම අද සිංහලයන් යම් පමණකට හෝ ආත්මාර්ථකාමී නම් එයට හේතුව ද ඔවුන්ගේ ආත්මීය පෞද්ගලිකත්වය සමාජයීය පෞද්ගලිකත්වය සමග බැඳී තිබීම ය.

අපට ඊනියා වික්ටෝරියානු සදාචාරය සාකච්ඡාකිරීමට සිදුවන්නේ ද මෙවැනි පසුබිමක ය. ඇතැමුන් සිතන්නේ පැරණි සිංහලයන් විවාහය ගැන තැකීමක් නොකළ හෝ නොදැනසිටි හෝ පිරිසක් ලෙස ය. ඔවුන් උපකල්පනයකරන්නේ එකල පිරිමියකු හා ගැහැණියක අතර ජීවිත කාලයක් පුරා පවතින සම්බන්ධයක් නොතිබූ බවත් ඉතා පහසුවෙන් එකිනෙකාගෙන් වෙන් ව වෙනත් අය සමග සම්බන්ධකම් ඇතිකරගැනීමට අවස්ථාව තිබූ බවත් ය. ඇතැමුන්ට අනුව අපට විවාහය යන සංස්ථාව ලැබී ඇත්තේ ද බටහිරයනගෙන් විශේෂයෙන් ම ලන්දේසීන්ගෙන් බව ය. ඔවුන් සිතනවා ඇත්තේ කසාදය, දික්කසාදය ආදී වචන ලන්දේසීන්ගෙන් ලැබීමත්, විවාහය ලියා පදිංචිකිරීම වැනි සංකල්ප බටහිරයන් පැමිණීමට පෙර නොතිබීමත් ආදී කරුණු හේතුකොටගෙන සිංහලයන් එකල එකට ජීවත් වන (living together) පිරිසක් ලෙස කල්ගෙවූ බව විය හැකි ය.

ඔවුන්ට මෙවැනි මත ඇතිකරගැනීමට රොබට් නොක්ස් මහතා ලියූ පොත ද ඉවහල්වන බව පෙනෙයි. රොබට් නොක්ස් මහතා යනු එතරම් උගත් පුද්ගලයකු නොවූ බව බොහෝ දෙනාට අමතකවන කරුණකි. ඔහු එකල ලංකාව දෙස බැලුයේ ඔහුගේ දෘෂ්ටි කෝණයෙනි. විවාහය පිළිබඳ ව මෙන් ම වෙනත් කරුණු ගැන ද ඔහු දහහත්වැනි සියවසේ එංගලන්තයෙන් උරුමකරගත් දැනුමක් විය. ඒ සමග ඔහුගේ චින්තනය වූයේ ද මූලික වශයෙන් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ය. එවකට එංගලන්තය වැඩවසම් කතෝලික චින්තනයෙන් මුළුමනින් ම බිඳී නොතිබුණෙන් ඔහුට ඒ චින්තනය ද යම් ප්‍රමාණයකට හෝ තිබෙන්නට ඇත.

ඒ අතර අපේ අවධානය යොමුවිය යුතු තවත් කරුණු දෙකක් වෙයි. එකක් නම් ඔහු ලංකාවට පැමිණියේ ලාබාල තරුණයකු ලෙස බව ය. ඔහුගේ පියා සමග මෙරටට පැමිණි ඔහු පියා මෙරට දී මියයනු දුටුවේ ය. ඔහු සමග පැමිණි ඇතමුන් ලංකාවේ සිංහල ගැහැණුන් සමග එක්වී පවුල් ජීවිත ගතකළ මුත් ඔහුට අවශ්‍ය වූයේ කවදා හෝ කෙසේ හෝ ආපසු එංගලන්තයට යෑම ය. මේ දෙවැනි කරුණ ද ඔහුගේ පොත කියවීමේ දී අප සැලකිල්ලට ගත යුතු ය. ඔහු එළිමහනේ ජීවත් වූ නමුත් ලංකාවේ දී ඔහු සිටියේ සිරකරුවකු ලෙස ය.

පොතක් හෝ ලිපියක් හෝ කියවන විට කතෘගේ පසුබිම (වාසදේස) ද දැනසිටීම වැදගත් ය. ඇතැම්විට කතුවරයා ගැන කිසිවක් නොදැන සිටිය ද ලියා ඇති දෙයින් යම් ප්‍රමාණයකට අදාළ පසුබිම දැනගත හැකි ය. කතුවරයාගේ පසුබිම දැනසිටිමින් කෘතියක් කියවීමත්, කෘතිය කියවීමෙන් කතුවරයාගේ පසුබිම දැනගැනීමත් අතර එක්තරා ආකාරයක චක්‍රීය සම්බන්ධයක් ඇත. කිසිම කතුවරයකු ඊනියා වාස්තවික දෑ නොලියන බව අමතක නොකළ යුතු ය. වාස්තවික දෑ ලිවීමට වාස්තවිකත්වයක් තිබිය යුතු ය. ඇතැමුන් තමන් ලියන්නේ වාස්තවික කරුණු යැයි සිතන්නේ ඔවුන්ට වාස්තවිකත්වයක් ඇති බව උගන්වා ඇති බැවිනි.

දහහත්වැනි සියවසේ එංගලන්ත දෘෂ්ටි කෝණයෙන් බැලූ විට එතරම් උගත්කමක් නැති අයකු ලංකාවේ දුටු දේ රොබට් නොක්ස් මහතාගේ කෘතියෙහි ඇතුළත් වෙයි. අඩුම තරමින් තම සගයන් සිංහල ස්ත්‍රීන් සමග පවුල් කෑ අන්දම සොයා බලා ඒ පිළිබඳව විශ්ලේෂණයක් කිරීමටවත් ඔහු පෙළඹී නැත. ඔහුගෙන් එවැන්නක් බලාපොරොත්තුවීම

© Prof. Nalin De Silva

ද අනුචිත ය. ඔහු මූලික වශයෙන් ම දුටුවේ සිංහලයන්ගේ විවාහයේ එක් අවස්ථාවක් පමණ ය. ඒ විවාහ වී සිටි දෙදෙනකු වෙන්වන අයුරු ය.

සිංහලයන් ඇඳුම් මාරුකරන්නාක් මෙන් සැමියන් හා බිරියන් මාරුකළ අය නොවන බව ඉතිහාසයෙන් පෙනී යයි. විවාහය යන සංස්ථාව මෙරටට හඳුන්වාදෙනු ලැබුයේ ලන්දේසීන් හෝ වෙනත් බටහිර ජාතියක් හෝ විසින් යැයි සිතිය හැක්කේ බටහිරයන්ගේ මතිමතාන්තර ඊනියා සිංහල පාඨකයන්ට හඳුන්වාදීම තම ජීවනෝපාය කරගත් අයට, ඊනියා දියුණුව අපට බටහිරයනාගෙන් ලැබිණි යැයි සිතීමට පුරුදුකර ඇත්තවුන්ට ආදීන්ට ය. විවාහය යන සංස්ථාව බටහිර දැඩි සංස්ථාවක් බවට පත්කරනු ලැබුයේ කතෝලික සංස්කෘතියෙනි. කතෝලික පල්ලියට අනුව විවාහය දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි සිදුවන දෙයක් බැවින් විවාහ වූ දෙදෙනකු මරණයට පත්වන තුරු වෙන් නොවිය යුතු ය. විවාහය සිදුවිය යුතු වූයේ පල්ලියේ ය. එය පල්ලියේ ලියාපදිංචි කෙරිණි. දික්කසාදය කතෝලික පල්ලියෙන් අනුමත නොවිණි. පැරණි සිංහලයන් අතර කතෝලික සංස්කෘතියේ එවැනි සිරිත් නො වී ය. එහෙත් ඉන් කියැවෙන්නේ මෙරට විවාහ නොසිදු බව නො වෙයි.

මෙරට රජවරුන්ට බිසවුන් සිටි බව අපි දනිමු. ඇතැමුන් සිතන්නේ මෙරට රජවරුන්ට ද භාරතයේ රජවරුන්ට මෙන් අන්ත:පුර තිබූ බව ය. එහෙත් පොදුවේ ගත්කල ඒ සඳහා සාධක නො මැත. කාවන්තිස්ස රජුගේ බිසව වූයේ විහාර මහා දේවිය ය. ඇතැම් රජවරුන්ට අගබිසව හැරෙන්නට වෙනත් බිසවුන් ද සිටි බව පෙනී යන නමුත් අන්ත:පුර තිබූ බවක් කිව නො හැකි ය. ඒ අතර සෙල්ලිපිවල නන්දිමිත්‍ර සෙනවිගේ බිරිය විසින් පූජාකරනු ලැබූ දැ ගැන සඳහන් වෙයි. බරුවා හා බිරිය යන වදන් අපට එකතුවූයේ බටහිරයන් පැමිණීමෙන් පසුව නො වෙයි. දීගය, බින්නය ආදී වචන මෙන් ම ආවාහ විවාහ යන වචන ද සිංහලයේ තිබීමෙන් පෙන්නුම්කරන්නේ ජීවත්වන්නේ ස්වාමියාගේ ගෙදර ද නැත්නම් භාර්යාවගේ ගෙදර ද යන්න අනුව ආදී වශයෙන් විග්‍රහකර ඒ ප්‍රකාශකිරීමට ද එදා සිංහලයන් කටයුතුකර ඇති අන්දම ය. මේ අතර අප  විවාහය සම්බන්ධයෙන් යොදාගෙන ඇති වැදගත් වචනයක් නම් සහේට ගැනීම ය. මේ වචනවලින් අපට පැරණි සිංහල සමාජයේ විවාහ සංස්ථාව ගැන වැදගත් නිගමන කිහිපයකට එළඹිය හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva